සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2017** — **8 ශ්‍රේණිය**
**முதலாம் தவணைப் பரீட்சை 2017** — **தரம் 8**
**First Term Test 2017** — **Grade 8**

**ක්‍රිස්තු ධර්මය – I කොටස**
**Christianity - Part 1**

**පැය එකයි**
***One hours***

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න**

1. සියලු මැවිලි අතරින් උතුම්ම මැවිල්ල වන්නේ .
   1. සතුන්ය. 2. මිනිසාය. 3. පරිගණකයකි.

2. ලෝකය නිර්මාණය කිරිමට අදාළ සිද්ධින් ශු බයිබලය තුළ ඉදිරිපත් කරන්නේ සංකේත මඟිනි. මෙහිදි සර්පයා ගෙන් සංකේතවත් වන්නේ
   1. සශ්‍රිකත්වය 2. දේව කැමැත්ත 3. නපුර

3. ඊශ්‍රායල් ජාතිකයන් මිසරයේ වහල් සේවයට රැගෙන ගිය සමයේ මිසරය පාලනය කළ පාලකයා වන්නේ
   1. හොරෝද් රජ. 2. පාරාවෝ රජ 3. දාවිත් රජ

4. යහපත් බැටළු එඬේරාගේ ලක්ෂණයක් නොවන්නේ ,
   1 පෝෂණය කිරිම
   2 හිංසාවට ලක් කිරිම
   3 රැකවරණය සලසා දීම

5. කිතුණු ජීවිතයේ අවසන් බලාපොරොත්තුව වන්නේ ,
   1. සදාතන ජීවනය උරුම කර ගැනීම
   2. සුභාරංචිය පැතිරවීම
   3. දේව ආශිර්වාද ලබා ගැනීම

6. ඊශ්‍රායල්වරු මිසරයේ වහලුන්ව සිටි කාල සීමාව නිවරුදිව දැක්වෙන පිළිතුර වන්නේ ,
   1. වසර 250
   2. වසර 400
   3. වසර 430

7. ජේසුස් වහන්සේ සාය ශ්‍රාවකත්වය සඳහා කැඳවාගත් පළමු ශ්‍රාවකයන් අතර අයකැමියෙකු ලෙස දිවි ගෙවූ ශ්‍රාවකයා වන්නේ ,

   1. මතෙව්ය
   2. ඇන්ඩෲය
   3. ජාකෝබ්ය

8. දේව සේවය සඳහා කැඳවීම් ලබන්නෙකු තුළ තිබිය යුතු ගුණාංගයක් නොවන්නේ ,

   1. අකීකරු කම
   2. අවංක බාවය
   3. ආත්මාර්ථකාමී බව

9. සේවය සඳහා ජේසුස් වහන්සේගේ කැඳවීම ලත් ශ්‍රාවකයන් ගණන වන්නේ

   1. 10 කි    2. 12 කි    3. 15 කි

10. නාසරෙත් නුවර සිදු කළ දේශනයේදී ජේසුස් වහන්සේ කියවීම සඳහා තෝරාගත් ග්‍රන්ථය වන්නේ

    1. යොසායා ග්‍රන්ථය    2. ගීතාවලිය ග්‍රන්ථය    3. රාජාවලිය ග්‍රන්ථය

11. දෙවියන් වහන්සේ මනුෂ්‍යයා හට අසමසම ස්ථානයක් උරුමකර දුන් බවට සනාත වන කරුණක් වන්නේ ,

    1. දූහුවිල්ලෙන් මිනිසා මැවීම
    2. ඒදන් උයන තුළ මිනිසා මැවීම
    3. දේව ස්වරූපය අනුව මිනිසා මැවීම

12. දේව මැවිල්ල සුරක්ෂිත කිරිමේ වගකීම පැවරුනේ ,

    1. සතුන් හටය    2. ජේසුස් වහන්සේ හටය    3. මිනිසා හටය

13. දෙවි සමිඳාණන් වහන්සේ විසින් මනුෂයා කෙරෙහි තබන ලද විශ්වාසය කඩ වු අවස්ථාවක් නොවන්නේ ,

    1. දෙවියන් වහන්සේට සමාන වීමට උත්සහ දැරිම
    2. දේව අණට අකීකරු වී තහනම් ගසෙහි ගෙඩි අනුභව කිරිම
    3. දෙවියන් වහන්සේ දේව මැවිල්ල සම්බන්ධයෙන් පැවරූ වගකීම් භාර ගැනීම

14. ඉශ්‍රායල්වරුන් හැඳින්වීම සඳහා භාවිතා වන තවත් නමක් වන්නේ ,

    1. දෙවියන් වහනිසේ විසින් තෝරාගත් ජනතාව
    2. ආශිර්වාද ලත් ජනතාව
    3. කරුණාව ලත් ජනතාව

15. විවිධාකාර වූ වහල් බැමි තුළ සිරවී සිටිනා අප ජීවිතය ඉන් මුදවා ගැනීමට අප විසින් සපුරා ලිය යුතු සුදුසු කමක් වන්නේ

   1. ලෞකික සැපසම්පත් කෙරෙහි ගැති වීම
   2. තාවකාලික අපහසුතා හමුවේ ප්‍රචණ්ඩකාරී වීම
   3. දේව කැමැත්තට අවනත වීම

16. මෙතැන් පටන් ඔබ මිනිසුන් දිනනු ඇත යන්නෙන් ජේසුස් වහන්සේ පැවසුවේ කා හටද ,

1. සිමෝන් හට 2. ජුදස් හට 3. මතෙව් හට

17. ධර්ම දූත මෙහෙවරෙහි ප්‍රධාන පණිවිඩය වන්නේ ,

   1. මනස්ථාපය තුළින් සුවර්ග රාජ්‍යයේ වටිනාකම් අවබෝධ කරගත යුතු බව
   2. තෝරාගත් පිරිසකට පමණක් සුභාරංචි ප්‍රකාශ කළ යුතු බව
   3. ධර්මිෂ්ඨයාට පමණක් දේව අත්දැකිය හැකි බව

18. සිය මෙහෙවරට අදාළව ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් වෙත පැවරූ කාර්යයක් නොවන්නේ ,

   1. යක්ෂාත්ම දුරු කිරිම
   2. රෝගීන් සුව කිරිම
   3. දේව වචනය අධ්‍යනය කිරීම

19. ධර්මදූත සේවයේදී ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ට දුන් මඟපෙන්වීම් අතර පාදවල දූවිලි ගසා දැමීමෙන් සංකේත වත් කරන්නේ ,

   1. පිරිසිදු බාවය
   2. පැමිණෙන දේව විනිශ්චය
   3. දේව පණිවිඩය ප්‍රතික්ෂේප කිරිම

20. ගීතාවලිය 23 වන ගීතිකාව නිර්මාණය කරන ලද්දේ ,

   1. දාවිත්ය
   2. දෙවියන් වහන්සේ ය
   3. ජේසුස් වහන්සේය

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2017** | **08 ශ්‍රේණිය**
மூன்றாம் தவணைப் பரீட்சை **2017** | தரம் **08**
**First Term Test 2017** | **Grade 08**

**ක්‍රිස්තු ධර්මය – II කොටස**
**Christianity - Part - II**

පැය දෙකයි
***Two hours***

**පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) I දෙවි පියාණන් මැවූ මුල්ම මිනිසුන් දෙදෙනා කවුද?

II ලෝකය නිර්මාණය කිරීමේ පුවතට අදාළ සිද්ධීන් සඳහා ශුඃ බයිබල් කතුවරයා යොදාගත් සංකේත දෙකක් ලියන්න.

III දෙවියන් වහන්සේ අතහැර පාපය තෝරා ගැනීම නිසා මිනිසා හට දෙවියන් වහන්සේ ලබා දුන් දෙආකාර දඬුවම් මොනවාද?

VI ඉශ්‍රායල් ජනයාගේ වර්ධනය මර්ධනය කිරීම සඳහා පාරාවෝ රජු ගත් ක්‍රියා මාර්ග දෙකක් ලියන්න.

V ජේසුස් වහන්සේගේ කැඳවීම ලත් ශ්‍රාවකයන් දෙදෙනෙකු නම් කරන්න.

VI ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් හට දුන් නව ආඥාව කුමක්ද?

VII දේව සේවය සඳහා කැඳවීම් ලබන පුද්ගලයෙකු තුළ තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න.

VIII ජේසුස් වහන්සේ ගේ මෙහෙවරහි ප්‍රධාන අරමුණු දෙකක් ලියන්න.

IX ධර්මදූත සේවය සඳහා පිටත්ව යාමේදී ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ට දුන් උපදෙස් දෙකක් ලියන්න.

X ජේසුස් වහන්සේ විසින් දේව පුත්‍රයාණන් ප්‍රතික්ෂේප කරන අයගේ විපාකය කෙසේද ? යන්න පැහැදිලි කිරීමට ගත් නිදසුන කුමක්ද ?

( 10 × 2 = 20 )

(02) I මැවිලි අතර උතුම් මැවිල්ල කුමක් ද?
( ල - 2 )

II දේව මැවිල්ල විනාශ වන අවස්ථා තුනක් ලියන්න.
( ල - 3 )

III "නිරන්තරයෙන් දේව කැමැත්ත ඉටු කිරීම කිතුණුවාගේ වගකීමයි " යන මැයෙන් පුවත් පතකට ලිපියක් ලියන්න.
( ල - 5 )

(03) I ඉශ්‍රායල් ජනයා වහල් බවින් මුදවා පොරොන්දු දේශය කරා ගෙන ඒමේ කාර්යභාරය පැවරුණේ කා හටද?

( ල - 2 )

II ඉශ්‍රායල් ජනයා පොරොන්දු දේශය කරා යන ගමනේදී දෙවියන් වහන්සේ ඔවුන්ට අවශ්‍ය රැකවරණයත්, පෝෂණයත් ලබා දුන් අවස්ථා දෙකක් ලියන්න.

( ල - 3 )

III ඔබ ජීවත්වන සමාජය තුළ විවිධ ලෙස වහල්භාවයට පත්ව සිටින පුද්ගලයින් උදෙසා කිතුණු දරුවකු ලෙස ඔබට කළ හැකි දෑ මොනවාදැයි ලියා දක්වන්න.

( ල - 5 )

(04) I දේව කැඳවීම යනු කුමක්ද?

( ල - 2 )

II ප්‍රේරිතයන් දොළොස් දෙනා කැඳවීමේ සිදුවීම තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ තුනක් ලියන්න.

( ල - 3 )

III දෙවියන් වහන්සේගෙන් උදෙසා සේවය කිරීමට ඔබට කැඳවීම් ලැබුනහොත් ඔබ ඒ සඳහා ක්‍රියා කරන ආකාරය ලියා දක්වන්න.

( ල - 5 )

(05) I ධර්ම දූත සේවය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද ?

( ල - 2 )

II ධර්ම දූත සේවයේදී ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් හට පැවරූ විශේෂ කාර්යයන් තුනක් ලියන්න.

( ල - 3 )

III ධර්ම දූත සේවයේදී අනුගමනය කළ යුතු මග පෙන්වීම් මාලාවක් පිළියෙළ කරන්න.

( ල - 5 )

(06) I පාපය නිසා මනුෂ්‍යයාහට හිමිවූයේ යැයි පැවසෙන මරණය කුමක්ද?.

( ල - 2 )

II දෙවියන් වහන්සේ වෙනුවට පාපය තෝරා ගත් මනුෂ්‍යයා හට දෙවියන් වහන්සේ ප්‍රේමය දැක්වූ ආකාරය ලියා දක්වන්න.

( ල - 3 )

III අයහපත වෙනුවට යහපත තෝරා ගැනීම ඔබ ජීවිතයට ඇතිවන ජීවිත පරිවර්තනය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

( ල - 5 )